දුරකථන/தொலைபேசிஇல. /Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister — 2784832

ලේකම් / செயலாளர் / Secretary — 2784812

කාර්යාලය / அலுவலகம் / Office — 2785141-50 Fax: 2784846

ඊ-මේල්/ஈ_மெயில்/E -mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල .
'இசுருபாயா"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. ..................

මගේ අංකය / எமது இல. / My No. ED/01/21/02/01

දිනය / திகதி / Date 2017. 5 14

චක්‍රලේඛ අංක : - 10/2017

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා
සියලු ම විදුහල්පතිවරුන් වෙත

## පාසල් ළමුන් සඳහා ක්‍රියාත්මක වන පෝෂණ වැඩසටහන

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සෘජුව ක්‍රියාත්මක වන (1) "පාසල් ළමුන් සඳහා ආහාර ලබා දීමේ රජයේ වැඩසටහන,(2) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ හා ලෝක ආහාර වැඩපිළිවෙලේ සහාය ඇතිව ක්‍රියාත්මක වන "අධ්‍යාපනය සඳහා ආහාර වැඩසටහන" හා (3)පෝෂණ අතිරේකයක් ලෙස නැවුම් කිරි වීදුරුවක් / කිරි පැකට් ලබා දීමේ වැඩසටහන " යන පෝෂණ වැඩසටහන් මෙම චක්‍රලේඛය මගින් ආවරණය වේ.

ඉහත පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සෑම වර්ෂයක ම ජනවාරි මස දෙවන සතියේ සඳුදා දින සිට ආරම්භ කළ යුතු අතර, ඒ සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු ය.

"නිරෝගී ක්‍රියාශීලී දරු පරපුරක් " යන්න මෙම වැඩසටහන්වල තේමාව වන අතර, පාසල් සිසුන් අතර පෝෂණ ගැටලු අවම කිරීම, දෛනික පාසල් පැමිණීම වර්ධනය කිරීම, යහපත් ආහාර පුරුදු හා සෞඛ්‍ය පුරුදු වර්ධනය කිරීම හා දේශීය ආහාර සංස්කෘතියක් ගොඩනැගීම තුළින් රටට වැඩදායී පුද්ගලයකු බිහිකිරීම අරමුණු වේ. පාසල්වල ක්‍රියාත්මක කරන ඕනෑම පෝෂණ වැඩසටහනක් මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා විය යුතු ය.

මෙම වැඩසටහන් සම්බන්ධයෙන් අධ්‍යාපන සේවා අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති 2015/01 අංක දරණ 2015.01.02 දිනැති චක්‍රලේඛය අභිබවා මෙම චක්‍රලේඛය මින් ඉදිරියට වලංගු වේ.

ඉහත වැඩසටහන සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු වේ.

1. පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පළාත් මට්ටමේ, කලාප මට්ටමේ, පාසල් මට්ටමේ දී සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුවලට, ආහාර කමිටුවට හා පාසල් සංවර්ධන සමිතියට පැවරේ.

   a. 1980 අංක 26 දරණ ආහාර පනතේ විධි විධාන අනුව ද, 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ පනත සහ එහි විධි විධාන අනුව ද , සෑම පාසලක ම සිසුන්ට සෞඛ්‍යාරක්ෂිත ආහාර ලබා ගැනීමේ පහසුකම් හා පෝෂ්‍යදායී ආහාර ලබා ගැනීමේ පහසුකම් ඇති කිරීම හා ඒ පිළිබඳ සහතික වීම.
   b. ආහාර සකස් කරන්නන්, ආහාර සපයන ස්ථාන හා භාවිත කරන උපකරණවල පවිත්‍රතාව පිළිබඳ සහතික වීම.
   c. සෞඛ්‍යයට හිතකර ආහාර පමණක් ලබා දීම.
   d. අධික තෙල්, අධික සීනි හා අධික ලුණු සහිත ආහාර ලබා දීමෙන් වැළකීම.

2. ආහාර හා කිරි ලබා දිය යුතු වේලාව
   - පාසල ආරම්භ කර පළමු පැය තුළ, උදෑසන 7.30 ත් 8.30 ත් අතර ආහාර ගැනීම සඳහා වෙන් වේ.
     නමුත් විශේෂ හේතු මත පමණක් මෙම කාලය තුළ ආහාර ලබා දීමට අපහසු වේනම් විදුහල්පති විසින් පෙ.ව. 9.30ට ප්‍රථම ආහාර ලබා දීමට කටයුතු කළ යුතු ය.
     සැ.යු. : ආහාර ගැනීම සඳහා විනාඩි 15ක කාලයක් යොදා ගැනීම අනිවාර්යය වේ.
   - කිරි ප්‍රධාන ආහාර වේලක් නොවන බැවින් කිරි ලබා දිය යුත්තේ උදෑසන 9.30 ත් 10.30 ත් අතර ය.

3. එමෙන් ම මෙම වැඩසටහන ආරම්භ කිරීමට පෙර විදුහල්පති ගිවිසුම හා ආහාර සැපයුම්කරු ගිවිසුම අත්සන් කර තිබීම අනිවාර්ය වේ.

4. පාසල් මට්ටමෙන්, අධ්‍යාපන කලාප මට්ටමෙන් හා පළාත් මට්ටමෙන් අධීක්ෂණ හා නියාමන ක්‍රියාවලිය සිදුකිරීම හා ඒ සම්බන්ධ වගකීම් නිසි පරිදි පැවරීම සිදු කළ යුතු ය.

5. පාසල් ආහාර ලබා දීම පිළිබඳ ඇගයීම හා නියාමනය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති 35/2015 අංක දරණ 2015.12.31 දිනැති පාසල් ආපනශාලා චක්‍රලේඛයේ සඳහන් පරිදි පාසල් සංවර්ධන සමිතිය විසින් වගකීම පැවරීමට පත්කරනු ලබන අනු කමිටුව වන "පාසල් ආහාර කමිටුව"ට පැවරේ. එම කමිටුව පාසල් පෝෂණ වැඩසටහන් ඇගයීම හා නියාමනය සඳහා ද බලවත්කරණය කිරීමට කටයුතු කළ යුතු ය.

   "පාසල් ආහාර කමිටුව" විදුහල්පති හෝ විදුහල්පති විසින් නම් කරනු ලබන නියෝජ්‍ය විදුහල්පතිවරයෙකුගේ ප්‍රධානත්වයෙන් පැවැත්විය යුතු අතර, එහි සාමාජික සංඛ්‍යාව සාමාජිකයන් 06ත් 12ත් අතර සංඛ්‍යාවක් විය යුතු ය. එහි සංයුතිය පහත පරිදි විය යුතු ය.

   - විදුහල්පති / නියෝජ්‍ය විදුහල්පති ( කමිටු ප්‍රධානී)
   - පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන කටයුතු භාර ගුරු මහතා හෝ මහත්මිය
   - වෙනත් ගුරුභවතෙකු

- ➢ පාසල අයත් ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක
- ➢ පාසල් සෞඛ්‍ය ශිෂ්‍ය සමාජයේ සාමාජිකයකු
- ➢ පරිසර හට කණ්ඩායමේ සාමාජිකයකු
- ➢ ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකයකු
- ➢ පාසල් සංවර්ධන කමිටුවේ සාමාජිකයකු
- ➢ ප්‍රධාන ශිෂ්‍ය නායක /නායිකාව හෝ වෙනත් ශිෂ්‍ය නායකයකු / නායිකාවක්
- ➢ පාසල් පාරිභෝගික කවයක සාමාජිකයකු

6. මීට අදාළව පහත සඳහන් තොරතුරු අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දීමට කටයුතු කළ යුතු ය.
   - පාසල් නාම ලේඛන හා ශිෂ්‍ය සංඛ්‍යා තොරතුරු - සෑම වර්ෂයක ම ජනවාරි 20වන දිනට පෙර
   - පළාත් මට්ටමින්, කලාප මට්ටමින් හා පාසල් මට්ටමින් මාසික වියදම් විස්තර - සෑම මාසයක ම 10 වන දිනට පෙර
   - සිසුන්ගේ දෛනික පැමිණීමේ සාරාංශය (වාරයකට වරක්)
   - ආහාර සැපයුම්කරුවන් පිළිබඳ තොරතුරු (සැපයුම්කරුගේ නම, ගිණුම් අංකය, බැංකුවේ නම හා බැංකු ශාඛාව) - සෑම වර්ෂයක ම ජනවාරි 20 වන දිනට පෙර
   - පාසල් සිසුන්ගේ පෝෂණ මට්ටම පිළිබඳ තොරතුරු (වාරයකට වරක්)
7. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කර ඇති ආහාර වට්ටෝරුවලට අනුකූලව ආහාර ලබා දීමට කටයුතු කළ යුතු ය. එසේ වුව ද පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුවල නිර්දේශ මත ප්‍රාදේශීය මට්ටමේ අවශ්‍යතාවය අනුව ආහාර වට්ටෝරු වෙනස් කර ගත හැකි අතර, ඒ පිළිබඳ ලොග් සටහනක් යෙදීමට කටයුතු කළ යුතු ය.
8. පෝෂණ වැඩසටහන් සඳහා මුදල් වියදම් කිරීම පහත පරිදි සිදුකළ යුතු ය.

   දෛනික පැමිණීම 100% හෝ 90%ට වැඩි අවස්ථාවල දී අනුමත සියලු ම සිසුන් 100% සඳහා වන මුදල ද , පැමිණීම 90% ට අඩු අවස්ථාවල දී සිසුන් 100% සඳහා වන මුදලින් 90% ක් ද ගෙවිය යුතු ය.

   - **පාසල් ළමුන් සඳහා ආහාර ලබා දීමේ රජයේ වැඩසටහන**

     - එක් ශිෂ්‍යයෙකුගේ එක් දිනක ආහාර වේල වෙනුවෙන් රු.28.00ක මුදලක් වෙන් කෙරේ. ( ආහාර වේල සඳහා ලබා දෙන මුදල වෙනස් වන අවස්ථාවන්හි දී පළාත් අධ්‍යාපන කාර්යාල හරහා දැනුවත් කිරීමට කටයුතු කරනු ලබයි.)

   - **ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ හා ලෝක ආහාර වැඩපිළිවෙලේ සහාය ඇතිව ක්‍රියාත්මක වන "අධ්‍යාපනය සඳහා ආහාර වැඩසටහන"**

     ලෝක ආහාර වැඩසටහන යටතේ සිසුන් සඳහා ආහාර ලබාදීම ක්‍රියාත්මක කෙරෙන අතර, මෙම වැඩසටහන යටතේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මගින් සහල්, තෙල්, පරිප්පු හා/හෝ ටින් මාලු ලබා දෙන අතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් එම ද්‍රව්‍ය පාසල් වලට ලබාදීම සිදු කෙරේ.

   අමතර ආහාර වර්ග මිලදී ගැනීම වෙනුවෙන් ඒක ශිෂ්‍ය පදනම මත පහත දක්වා ඇති ආකාරයට මුදල් වෙන් කෙරේ.

| පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව | එක් ආහාර වේලක් සකස් කිරීමට අවශ්‍ය ද්‍රව්‍යමය භාණ්ඩ සඳහා එක් ශිෂ්‍යයකුට ලබා දෙන මුදල (Greenery Fund per meal) |
|---|---|
| ශිෂ්‍ය සංඛ්‍යාව 50 ට අඩු නම් | රු. 7.00 |
| ශිෂ්‍ය සංඛ්‍යාව 50 – 100 ත් අතර නම් | රු. 5.00 |
| ශිෂ්‍ය සංඛ්‍යාව 100 – 200 ත් අතර නම් | රු. 4.00 |
| ශිෂ්‍ය සංඛ්‍යාව 200 ට වැඩි නම් | රු. 3.50 |

ආහාර ලබාදෙන දිනවල දෛනික පැමිණීම අනුව මෙම මුදල් ලබා දීම සිදුකෙරේ.

- **පෝෂණ අතිරේකයක් ලෙස "නැවුම් කිරි වීදුරුවක් / කිරි පැකට් ලබා දීමේ වැඩසටහන"**
  - නැවුම් කිරි වීදුරුවක් ලබා දීමේ වැඩසටහන

    පාසල පිහිටි ප්‍රදේශයෙන් නැවුම් කිරි ලබා ගැනීමට හැකියාවක් පවතී නම් අධ්‍යාපන අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය සහිතව එම පාසල සඳහා නැවුම් කිරි ලබා දීම සිදු කළ හැකි ය.

    කිරි ලීටරයක් සඳහා කිරි සැපයුම්කරුවන්ට රු.70/-ක් හා අනෙකුත් ද්‍රව්‍ය වෙනුවෙන් පාසලට රු.5/- ලෙස රු.75/-ක මුදලක් වෙන් කෙරේ.
  - කිරි පැකට් ලබා දීමේ වැඩසටහන

    අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය හා මිල්කෝ ආයතනය සමග ගිවිසුම් අත්සන් කරනු ලබන අතර, පාසල වෙත ම කිරි පැකට් ලබා දීම සිදු කෙරේ.

9. ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටු රැස්වීම පහත සඳහන් පරිදි සිදු විය යුතු ය.

රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශ මට්ටමෙන්
- මෙහෙයුම් කමිටුව වර්ෂයකට දෙවරක්
පළාත් මට්ටමෙන් - වර්ෂයකට දෙවරක්
කලාප මට්ටම - පාසල් වාරයකට එක් වරක්
පාසල් මට්ටම - මාසික ව රැස්වීම් පැවැත්වීම අපේක්ෂා කෙරේ.
( මෙහි වාර්තා පවත්වා ගැනීම ද අවශ්‍ය වේ)

} සාරාංශ වාර්තා අමුණා එවිය යුතු ය.

පළාත් හා කලාප මට්ටමේ රැස්වීම් සඳහා රජයේ අනුමත දීමනා ගෙවිය හැකි ය.

*සැ.යු:*

- දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් පවත්වනු ලබන මාසික රැස්වීම සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ හා ලෝක ආහාර වැඩපිළිවෙලේ සහාය ඇතිව ක්‍රියාත්මක වන "අධ්‍යාපනය සඳහා ආහාර වැඩසටහන" පිළිබඳ වගකීම දරන කලාප නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ සහභාගි විය යුතු ය.

- පළාත් හා කලාප මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් වාර්තාවේ පිටපතක් අධ්‍යාපන අමාත්‍යාංශයට එවිය යුතු අතර, පාසල් මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් වාර්තා කලාප අධ්‍යාපන කාර්යාලයට එවිය යුතු ය.

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය මග පෙන්වීම " පාසල් පෝෂණ වැඩසටහන් සඳහා උපදෙස් සංග්‍රහය" තුළ ඇතුළත් වන අතර එයට අනුකූලව ක්‍රියා කිරීමට කටයුතු කළ යුතු ය.

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ද, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ද එකඟතාවය මත මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත :- ජනාධිපති ලේකම්
ලේකම් - ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
ලේකම් - සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
ලේකම් - අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය
ලේකම් - ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය
විගණකාධිපති
සියලු ම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
සියලු ම දිස්ත්‍රික් ලේකම්වරුන්
දේශීය නියෝජිත - එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩපිළිවෙල
අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම මාණ්ඩලික නිලධාරීන්